කුරුණෑගල මහා නගර සභාව - 2022

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

කුරුණෑගල මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කුරුණෑගල මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය කිරීමේ කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළ කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ජල සැපයුම් තැන්පතු රු.227,000 කින්ද, ගෙවා ඇති රු.1,619,989 ක් වූ මිශ්‍ර තැන්පතු 09 ක් නොගෙවූ තැන්පතු ලෙසද, රු.2,288,127ක් වූ මිශ්‍ර තැන්පතු 05 ක් දෙවරක් ගිණුම්ගත කිරීමෙන්ද, තැන්පතු ගිණුම් එම වටිනාකම් වලින් වැඩියෙන් දක්වා තිබුණු අතර, ජල සැපයුම් තැන්පත් රු.129,609 ක් හා මිශ්‍ර තැන්පතු රු.1,877,235 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අදාල මුදල උපලේඛනයට පිටපත් කිරීමේදී සිදු වූ දෝෂයකි. ඒ අනුව උප ලේඛනය නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වියදම් ණයහිමියන් රු.728,682,823 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2017 සිට 2022 වර්ෂය දක්වා ගොඩනැගී ඇති ශේෂයන්හි එකතුවකි. ඒ අනුව 2023 ජනවාරි 31 දිනට ගෙවා නිම කරන ලද මුදල අඩු කිරීමෙන් පසු ඉතිරි ශේෂය සඳහන් කර ඇති බව. | -එම- |
| (ඇ) | උසාවි දඩ මුදල පෙර වර්ෂයේ රු.1,053,350 කින් හා සමාලෝචිත වර්ෂයේ රු.3,822,100 කින් හා මුද්දර ගාස්තු රු.86,155,560 කින්ද අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මුද්දර ගාස්තු හා උසාවි දඩ සම්බන්ධව ගෙවීම් විස්තරයක් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් නොලැබුණු අතර ඒ හේතුවෙන් නිසි පරිදි හිඟයක් හඳුනාගැනීමට නොහැකි වී ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2015 වර්ෂයේදී පොදු කටයුතු සඳහා ලැබුණු වටිනාකම රු.12,500,000 ක් වූ රුඩ් 02 පර්චස් 18.7ක් වූ ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | සේවක ඇප තැන්පත් ගිණුම වගකීම් හා වත්කම් ශේෂ සමානව දැක්විය යුතු වුවත් වගකීම් ලෙස 1,187,440 ක් ලෙසත් වත්කම් ලෙස රු.1,200,313 ක් ලෙසත් ගිණුම්ගත කර තිබුණි. | 2022 ජනවාරි මස තැන්පත් වූ මුදල තුළ 2021 දෙසැම්බර් මස දෛනික වැටුපෙන් අයකළ ඇප තැන්පත් ඇතුළත්ව ඇති අතර, 2022 දෙසැම්බර් මස දෛනික වැටුපෙන් අයකළ ඇප තැන්පත් 2023 වර්ෂයේදී ඇප ආයෝජන ඇතුළත් කිරීම හේතුවෙන් මෙම වෙනස පැන නැගී ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | කල්බදු ක්‍රමයට ලබාගෙන තිබූ වාහනවල කල්බදු ණයහිමි ගිණුමේ ශේෂය රු.2,151,256 කින් අඩුවෙන් දක්වා තිබුණි. | කල්බදු ණයහිමි ගිණුමේ ශේෂය නිවැරදි කරන බව. | -එම- |
| (උ) | කල්බදු පොලී ගිණුම රු.17,878 කින් හා ස්ථාවර තැන්පත් පොලී රු.368,135 කින් පොලී ආදායම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | කල්බදු පොලී ගිණුමේ ශේෂය හා ස්ථාවර තැන්පතු පොලී ගිණුම නිවැරදි කරන බව. | -එම- |
| (ඌ) | ස්ථාවර තැන්පතු වලින් සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු පොලිය රු.551,184 ක් ගිණුම්ගතකර නොතිබුණි. | ලැබිය යුතු පොලිය රු.551,184ක මුදල නිවැරදිව ගිණුම්ගත කරන බව. | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මිශ්‍ර අත්තිකාරම් ශේෂය තුළ පියවා තිබූ රු.24,923,702 ක් වටිනා අත්තිකාරම් ශේෂ 07 ක් ඇතුළත්ව තිබුණි. | මිශ්‍ර අත්තිකාරම් උප ලේඛනයට පිටපත් කිරීමේදී සිදු වූ දෝෂයකි. අදාළ උපලේඛන නිවැරදි කරන බව. | -එම- |
| (ඒ) | පොදු හා විදුලි ගබඩාවට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රු.1,447,137 ක් වටිනා තොග අයිතම් 59 ක ඌනතාවයක් හා රු.173,984 ක් වටිනාකමැති තොග අයිතම 27 ක අතිරික්තයක් පැවති අතර එම අතිරික්ත තොග ශේෂ හා ඌන තොග ශේෂ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ලැබී නොතිබීම හේතුවෙන් ඇතුළත්ව නැත. 2023 වර්ෂයේදී මේ සඳහා ගැලපීම් සිදු කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය යටතේ දුරකතන දීමනාව හා ඉන්ධන දීමනාව පිළිවෙලින් රු.264,937 ක් හා රු.611,700 ක් ගිණුම්ගත කිරීම නිසා එම වටිනාකමින් වැටුප් ප්‍රතිපූර්ණ වැඩියෙන් දැක්වේ. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව නිලධාරින්ට හිමි දීමනාවන් වන බැවින් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ඉල්ලුම් කර ඇත. නමුත් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මෙම දීමනා ප්‍රතිපූර්ණය කර නොතිබීම හේතුවෙන් මෙම ශේෂය පැනනැගී ඇති බව. | ප්‍රතිපූර්ණය නොවන දීමනා ඉල්ලුම් කිරීමට කටයුතු නොකළ යුතුය. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සුන්දරාපොළ කසළ අංගනයේ පැවති රු.4,364,443 ක් වටිනා පොහොර බෑග් තොගය ගිණුම්ගත කර නොතිබුණි. | සුන්දරාපොල කසළ අංගනයේ අවසන් තොගයට අදාල පොහොර බෑග්වල වටිනාකම ඇතුළත් කර නිවැරදි කරන බව. | සභාවේ විවිධ ඒකකවල පවතින තොග ගිණුම්ගත කළ යුතුය. |
| (ක) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදල් ශේෂය රු.661,525 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | දේශීය ණය සංවර්ධන අරමුදල ශේෂය නිවැරදි කරන බව. | නිවැරදිව ශේෂ හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ග) | මහා නගර සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු වියදම් ණයහිමියන් නිශ්චිතව හඳුනාගත හැකිව තිබියදීත් මේ වෙනුවෙන් උපකල්පිත ප්‍රතිපාදන වෙන්කිරීමට කටයුතු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේද ණයහිමි රු.1,459,721,790 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | පසුගිය වර්ෂ තුළ වැඩිපුර වෙන්කර තිබූ ණයහිමියන් නිරවුල් කර නිවැරදි කිරීමේ අරමුණින් මෙම ණයහිමි කපාහැරීම සිදුකර ඇති අතර සමාලෝචිත වර්ෂයේදී එක් එක් දෙපාර්තමේන්තු විසින් කරන ලද ඉල්ලීම් අනුව ණයහිමි ශේෂයන් නිශ්චිතව හඳුනාගෙන මෙම ණයහිමි වෙන්කිරීම සිදුකර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව විසින් බාහිර පාර්ශවයන් 19 කට නඩු පවරා තිබූ අතර, සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 12 දෙනෙක් නඩු පවරා තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | බාහිර පාර්ශවයන් වෙත පවරා ඇති නඩු අසම්භාව්‍ය බැරකම් වශයෙන් ගිණුම්කරන සටහන් මගින් අනාවරණය කරන බව. | නඩු කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.3 නොසැසඳුණු පාලන ගිණුම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.2,775,676,122 ක් වූ ගිණුම් විෂයයන් 17 කට අදාළ ශේෂය හා උපලේඛනවල දැක්වෙන ශේෂය අතර රු. 207,846,280 ක වෙනසක් විය. | ගිණුම් විෂයයන් 17 ට අදාල උපලේඛන නිරවුල් කරමින් පවතින අතර ඉදිරියේදී අදාල උපලේඛන නිවැරදි කරන බව. | නොසැසඳීමට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදල විසින් ඉදිරිපත් කරන ලද ණය ශේෂ සනාථ කිරීම් අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණය ශේෂය සැසඳීමේදී රු.164,602 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාල ගැලපීම නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලොචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර තැන්පත් 03 ක ශේෂයන් හා බැංකු සනාථ ලිපිවල දැක්වෙන ශේෂයන් අතර රු.5,162,143 ක වෙනසක් විය. | ස්ථාවර තැන්පත් ගිණුමේ ශේෂය නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලොචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 2,527,198,696ක් වූ ස්ථාවර වත්කම්, තොග, ණයහිමි ශේෂයන්ට අදාළ උපලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | උපලේඛන සකස් කරමින් පවතින අතර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂයන් හා ගණුදෙනු තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් හා උචිත සාක්ෂීන් විගණනයට ලබා දීමට කටයුතු කළ යුතුය. |

**1.7** අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනතේ 252 අධිකාරිය - 188 වගන්තිය | මහා නගර සභා ආඥා පනත යෙදවීම පිළිබඳව නීතිමය ප්‍රතිපාදන සලසා නැති නාගරික සභිකයෙකුගේ රෝග තත්ත්වයක් සඳහා ආධාර ලබාදීම පිණිස 2022 අප්‍රේල් 05 දිනැති අංක 198 දරණ වවුචරයෙන් රු.1,000,000 ක් ගෙවීම් කර තිබුණි. | සභා තීරණය මත ගෙවීම් සිදු කර ඇති බව. | යථෝක්ත පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය- XIX වැනි පරිච්ඡේදයේ 5.4.1 වගන්තිය | රජයේ නිවාස ලබා ගැනීමට හිමිකම් ලබන නිලධාරියාට උපලේඛනගත නිවාස ලබා ගැනීමට හිමිකම් තිබේ නම්, එම නිලධාරියාගේ වැටුපෙන් සියයට 10ක් අයකරගත යුතු වුවත් එසේ අය නොකර නගර සභාව විසින් 2021 අගෝස්තු මස GC/06/01/2021/8/5/ MA/R9 දරන සභා සම්මුතිය මත උපලේඛනගත නිල නිවාස හිමිකම ඇති නිලධාරින්ගෙන් දැනට අයකරනු ලබන මාසික කුලියට සියයට 20 ක් වැඩිකර නිවාස කුලී අයකිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව ආයතන සංග්‍රහයට අනුව කුලී අය නොකිරීම නිසා 2021 හා 2022 වර්ෂවල කුලිය රු.221,589 ක් අඩුවෙන් අයකර තිබුණි. | ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5.4.1 වගන්තිය අනුව ඉදිරියේදී ගිවිසුම්ගතවන අය සඳහා අය කිරීමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි- මුදල් රෙගුලාසි 371(3) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.776,181 ක අත්තිකාරම් පියවා නොතිබුණි. | ඉදිරියේදී සෑම වසරකම දෙසැම්බර් 31 දිනට පෙර අත්තිකාරම් පිටවීමට කටයුතු කරන ලෙස සියළු නිලධාරින් දැනුවත් කර ඇති බව. | යථෝක්ත මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.12,835,988 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.759,129,083 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කර තිබූ අගරු චෙක්පත් උපලේඛනයට අනුව මාස 01 සිට වසර 15 ක් දක්වා පවතින අගරු වූ චෙක් 23 කට අදාළව රු.1,155,634 ක ශේෂය සමාලෝචිත වර්ෂය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අගරු චෙක්පත් 23 කට අදාල ශේෂය 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලංකා බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් පොතේ ශේෂය රු.18,747,889ක් වුවත් එදිනට පිළියෙළ කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මුදල් පොතේ ශේෂය ලෙස රු.63,879 වීමෙන් රු.18,684,010 ක වෙනසක් නිරීක්ෂණය විය. | බැංකු සැසඳුමෙහි රු. 18,684,010 ක මුදලක් හදුනා නොගත් ගෙවීම් යටතේ දක්වා ඇති බව. | ශේෂය හඳුනාගෙන නිවැරදි බැංකු සැසඳුම් පිළියෙළ කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම්, රැස්කල ආදායම් හා හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම් | 2022 බිල් කළ ආදායම් | 2022 රැස්කළ ආදායම් | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තුගත ආදායම් | 2021 බිල් කළ ආදායම් | 2021 රැස්කළ ආදායම් | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 369,500 | 344,497 | 355,480 | 255,777 | 354,500 | 338,186 | 290,396 | 253,166 |
| කුලී | 88,824 | 71,367 | 72,414 | 14,584 | 99,108 | 66,358 | 65,248 | 13,106 |
| බලපත්‍ර ගාස්තු | 15,380 | 19,489 | 19,489 | - | 15,430 | 12,834 | 12,834 | - |
| වෙනත් ආදායම් | 539,427 | 423,604 | 523,956 | 42,960 | 753,702 | 383,442 | 380,001 | 146,382 |
| **එකතුව** | 1,013,131 | 858,957 | 971,339 | 313,321 | 1,222,740 | 800,820 | 748,479 | 412,654 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු** | | |
| 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශයේ ගොඩනැගිලි 508 ක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දී ඇතත්, මෙම ගොඩනැගිලි වලින් වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂය තුළ නිකුත් කරන ලද අනුකූලතා සහතික සංඛ්‍යාව 399 වන අතර එම දේපළ අතරින් 309 ක් නව වරිපනම් දේපළ ලෙස එකතු කර තිබුණු බව. | සභාවට ආදායම් උත්පාදන මාර්ග සොයා බලා ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **කුලී** | | |
| නගර සභාව සතු කඩ කාමර 261 කින් 2022 ජූලි 31 දින වන විට රු.8,110,667 ක හිඟ කඩකුලී මුදලක් හා රු.555,975 ක දඩ මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මාස තුනකට වඩා හිඟ තිබූ සියළු කඩ කාමර සඳහා හිඟ අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**වෙනත් ආදායම්**

| | | | |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති මළාපවහන පද්ධතියේ හිඟ ආදායම් ශේෂය රු.86,890,230 ක් වූ අතර එයින් රු.11,991,634 ක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු අතර 2022 වර්ෂයට අදාළ බිල් කිරීම් රු.46,415,580 කින් රු.12,788,270 ක් ලැබී තිබුණි. වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු මළාපවහන පද්ධතියේ හිඟ ශේෂය රු.108,225,898 ක් විය. | හිඟ ආදායම් මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | හිඟ ආදායම් හා බිල්කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මහා නගර සභා බලප්‍රදේශයේ කොට්ඨාශ 12 ක ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු 128 ක් මඟින් සභාවට ලැබිය යුතු 2022 වර්ෂයට අදාළ වන හිඟය රු.7,592,550ක් විය. | මෙම පුවරු සඳහා 2022 වසරට අදාළ ප්‍රදර්ශන ගාස්තු ගෙවන ලෙස අදාළ ආයතන ලිඛිතව දැනුවත් කර ඇති අතර, එම මුදල් නොගෙවුවහොත් ඉවත් කිරීමට කටයුතු යොදා ඇති බව. | අතුරු ව්‍යවස්ථාව අනුව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 වර්ෂයේදී නගරාධිපති නිල කාමරය සඳහා මිලදීගත් කාර්යාල උපකරණ පිළිබඳව භෞතික පරීක්ෂාවේදී රු.329,450ක් වටිනාකම් ඇති පුටු 29 ක් භාණ්ඩ සැපයූ පෞද්ගලික ආයතනය වෙත ආපසු යවා තිබූ අතර එම පුටු සඳහාද ආයතනය වෙත මුදල් ගෙවීම් කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ සඳහා ආපසු යවන ලද පුටු 29 වෙනුවට නැවත පුටු 29 ක් කුරුණෑගල මහා නගර සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිවරදි කිරීමට කටයුතු කර ඇති බව. | භාණ්ඩ සැපයීම කළ පසු මුදල් ගෙවිය යුතු අතර, සැපයීම් නොකළ භාණ්ඩ සඳහා මුදල් ගෙවීම හේතුකරගෙන සිදු වූ පාඩුව ඒ සඳහා වගකිව යුතු අයගෙන් අයකර ගත යුතුය. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුරුණෑගල නගරය සංවර්ධනය කිරීමට අදාලව ජලාපවහන සැලැස්ම (Master Drainage Plane) සංශෝධනය කිරීමට අදාල ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා 2022 මැයි 17 දින රු.540,000 ක මුදලක් වැට් මුදල්ද සහිතව අත්තිකාරමක් වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවා තිබුණි. 2022 මැයි 06 දින අංක GC/06/62/2022 /04/ 20/MED/C7 දරන මහා සභා සම්මුතියට අනුව කුරුණෑගල නගරය සංවර්ධනය කිරීමට අදාලව ජලාපවහන සැලැස්ම සංශෝධන කිරීමට අදාල කාර්යය කඩිනමින් අවසන් කළ යුතු අවශ්‍යතාවයක් ලෙස මෙම කාර්යය ඉටුකිරීමට අත්තිකාරම් ලබා දී තිබුණද 2022 දෙසැම්බර් 31 වන විටත් ඉටුකර නොතිබුණි. | සැළැස්ම සකස් කර ඇති අතර, අවසන් අනුමැතියෙන් පසු ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බව. | සැලසුම් සහගතව කටයුතු කිරීමෙන් නිශ්කාර්යය වියදම් වළක්වා ගත යුතුය. |

## 3.3 අයවැයගත ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ රු.11,197,871 ක අයවැය ප්‍රතිපාදන සලසා තිබූ කර්මාන්ත 22 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි. | භාණ්ඩ මිළ ඉහළ යාම මත වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ ඉටු කිරීමට නොහැකි වීම මත ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ව්‍යාපෘති පූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත 2019 වර්ෂයේදී රුපියල් මිලියන 123ක් වටිනා කවෂිමා කොම්පෝස්ට් යන්ත්‍රය සුන්දරාපොළ කසල අංගනයේ ස්ථාපිත කර තිබුණි. මෙම යන්ත්‍රයේ ධාරිතාව ටොන් 50 ක් වුවත් දිනකට කසල ටොන් 30ක් පමණ යෙදීමෙන් උපරිම ධාරිතාව ප්‍රයෝජනයට නොගන්නා බව නිරීක්ෂණය විය. | කවෂිමා යන්ත්‍රයේ උපයෝජන ධාරිතාවය ටොන් 50 ක් වන අතර, ඉදිරි තත්වයන් පුරෝකථනය කරමින් මෙම යන්ත්‍රය ස්ථාපනය කර ඇත. කුරුණෑගල මහා නගර සභා බලප්‍රදේශයේ දෛනිකව ජනනය වන කසල ප්‍රමාණය ටොන් 30ක් පමණ වන බව. | යන්ත්‍රයෙන් උපරිම ධාරිතාව ප්‍රයෝජනයට ගෙන කොම්පෝස්ට් නිශ්පාදනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මාසිකව කිලෝග්‍රෑම් 600,000 ක දිරන කසළ ප්‍රමාණයක් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට එක්රැස් කරන අතර එම දිරන කසළ යොදාගෙන කොම්පෝස්ට් නිෂ්පාදනය කර තිබූ අතර නිශ්චිත නිෂ්පාදන ඒකක ප්‍රමාණයක් විගණනයට තහවුරු නොවූ අතර සමාලෝචිත වර්ෂය තුළදී කිලෝග්‍රෑම් 188,336 ක් අලෙවි කර රු.1,883,362 ක ආදායමක් උපයාගෙන තිබුණි. | මෙම තත්ත්වයන් පාලනයට කටයුතු කර ඇති බව. | දිරන කසළ හා නොදිරන කසළ විධිමත්ව කළමනාකරණය කළ යුතුය. |
| (iii) | නොදිරන කසළ කිලෝග්‍රෑම් 18,043 අලෙවියෙන් රු.399,709 ක ආදායමක් උපයා තිබුණු අතර හොල්සිම් ආයතනයට ටොන් 48 ක් පමණ නොදිරන කසළ ලබාදී ඇතත් මේ පිළිබඳව නිශ්චිත තොරතුරක් විගණනයට අනාවරණය නොවීය. | -එම- | නොදිරන කසළ පරිසරයට හානියක් නොවන පරිදි විධිමත්ව බැහැර කළ යුතුය. |

### 3.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පස් වසරකට වරක්වත් බදු කුලිය සංශෝධනය කළ යුතු වුවත් නගර සභාව සතු කඩ කාමර 571 ක් 2005 වර්ෂයේ අයකල කුලිය නැවත තක්සේරු කිරීමකින් තොරව අයකර තිබුණි. | කඩ කාමර වල නව තක්සේරු පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපි තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද පසු එම මාසයේදීම මහා සභාව වෙත අදාල තොරතුරු යොමු කර අදාල අනුමැතීන් ලබා ගෙන ඇති බව. | වර්තමාන තක්සේරුව අනුව කඩ කුලිය අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නාගරික සංවර්ධන පනත අනුව භූමි සීමාව තුළ ඉදිකිරීමක් සිදු කිරීමේ දී ගොඩනැගිලි සැලැස්මක් අනුමත කළ යුතු වුවද කුරුණෑගල මහා නගර සභා භූමියේ බහුකාර්යය විදුලි හා දූරකථන සම්ප්‍රේෂණ කුළුණ ඉදිකිරීමේදී මහා නගර සභාව විසින් සැලැස්මක් අනුමත කර නොතිබුණි. දූරකථන සම්ප්‍රේෂණ කුළුණ සඳහා පිළිබඳ බිම් කුලිය තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තක්සේරුකල යුතු වුවද එලෙස තක්සේරු කිරීමකින් තොරව බිම් කුලිය තීරණය කර තිබුණි. | මේ වන විට අදාළ බිම් කොටස සඳහා වෙනම පිඹුරුපතක් සකස් කිරීමට අදාල කටයුතු කරමින් පවතී. එය ලද වහාම තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර අදාල සංශෝධනයන් සිදු කරන බව. | ඉදිකිරීම් සිදු කිරීමේදී සැලසුම් අනුමත කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහා නගර සභාව විසින් නවීකරණය කරන ලද MC PLAZA හි කඩ කාමර 11 ක් බදු දී තිබූ අතර ඒ පිළිබඳව පරීක්ෂාවේදී පළාත් පාලන ආයතනයක සීමාව ඇතුළත්වන එක් එක් දේපලක කුලී හා අවම ලංසු වටිනාකම ප්‍රධාන තක්සේරුකරු හෝ පළාත් පාලන ආයතනය විසින් පත්කරනු ලබන සුදුසුකම් ලත් තැනැත්තන් විසින් තක්සේරු කළ යුතු වුවද එම උපදෙස් අනුගමනය නොකර ආදායම් පරීක්ෂකගේ තක්සේරුවකට අනුව බදු දීමට කටයුතු කර තිබුණි. | කඩකාමර තක්සේරු කිරීම සඳහා ප්‍රධාන තක්සේරුකරු වෙත යොමුකර ඇති අතර එය කඩිනමින් ගෙන්වා ගැනීම සඳහා කටයුතු කර ඇති බව. | වර්තමාන තක්සේරුව අනුව කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | Mottor lorry Compactor රථය තක්සේරු කර ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | Motor Lorry Compactor රථයේ වටිනාකම ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහා නගර සභාව සතු එක් ඉඩමක් පමණක් ගිණුම්ගත කර තිබුණු අතර සභාව සතු ඉඩම් 89 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු ඉඩම් 89 ක් 2023 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ඊ) | පරිගණක හා උපාංග ගිණුම්ගත කිරීමේදී 2020, 2021 හා 2022 වර්ෂවල මිලදීගත් පරිගණක හා උපාංග පමණක් ගිණුම්ගත කර තිබුණු අතර ඊට පෙර මිලදීගත් පරිගණක හා උපාංග ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු සියළු පරිගණක හා උපාංග 2023 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

## 3.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ ලේක් ස්ටුඩියෝ අසල අතීතයේ වැසිකිලියක් ඉදිකර තිබූ පර්චස් 3.14 ක පමණ වපසරියකින් යුත් රජය සතු ඉඩමේ මහා නගර සභාව විසින් මීටර 10 දිග හා මීටර 5 ක් පමණ පළල දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අත්තිවාරම (Foundation) දමා 9x9 ප්‍රමාණයේ කුළුණු (Columns) දමා තිබුණ අතර, මේ සඳහා වූ සැලසුම් (drawing), අනුමැතියක් හා ඉදිකිරීම් සම්බන්ධ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය. | අදාළ තොරතුරු පරීක්ෂා කර බලා කඩිනමින් විගණනයට තොරතුරු ඉදිරිපත් කරන බව. | ඉදිකිරීමක් සිදු කිරීමේදී සැලසුම් අනුමත කරගත යුතුය. |

## 3.7 වත්කම් කළමනාකරණය

### 3.7.1 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාවේ හිඟ ජල ආදායම අයකර ගැනීම සම්බන්ධයෙන් 2021 පෙබරවාරි 09 වන දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී විගණකාධිපති සටහනේ ඡේද අංක 2.1 ට ලබා දුන් නියෝග “හිඟ මුදල් වහාම අය කරගෙන ඒ පිළිබඳ වාර්තාවක් මසක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත්” “අදාළ නළ පද්ධති අළුත්වැඩියා කර අපතේ යන ජල ප්‍රමාණය නැවැත්වීමට කටයුතු කරන ලෙසත් අදාළ අලාභය පාරිභෝගිකයාට ලබා දෙන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි /ග.නි වෙත නියෝග කර තිබුණි.” නමුත් වර්තමාන තත්ත්වය පරීක්ෂා කිරීමේදී 2022 දෙසැම්බර් 31 දිනට රු.66,172,032 ජල හිඟ පවතින පාරිභෝගකයින් 7782 දෙනෙකුගෙන් අයකර ගත යුතුව තිබුණි. මෙම හිඟයෙන් වසරකට වැඩි ජල පාරිභෝගිකයින්ගෙන් අයකළ යුතු මුදල රු.19,030, 289 ක් විය. | හිඟ ජල ගාස්තු කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | රජයේ ගිණුම් කාරක සභාව ලබාදුන් නියෝග ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 2020 ජූලි 16 වන දිනැති GC-6(48) දරන මහා සභා සම්මුතිය යටතේ මහා නගර සභාවේ සභිකවරුන් වෙත වට්ස්ඇප් හෝ ඊමේල් මඟින් සභා වාර්තා ලබා දීම පහසුකරලීම සඳහා ඔවුන් වෙත ලැප්ටොප් පරිගණක එකක් රු.194,000 ක් වැයකර නාගරික සභිකයින් 19 දෙනෙකුට හා රියදුරු මහතෙකු සඳහා ලැප්ටොප් පරිගණක ලබා දී තිබුණි. පළාත් පාලන ධුර කාලය අවසන් වූ 2023 මාර්තු 19 දිනට දින දෙකකට පෙර එනම් 2023 මාර්තු 17 වන දින පැවති මහා සභාවේ තීරණ අංක SC/67/2023/03/ 17/MSD/CA යටතේ ලබා දුන් ලැප්ටොප් පරිගණක තක්සේරු වටිනාකම අයකර ගරු සභිකවරුන් වෙත ලබාදීමට සුදුසු බවට මහා සභාව ඒකමතිකව තීරණය කර තිබුණී. ඒ අනුව පරිගණකයක වර්තමාන තක්සේරුව රු.266,333 ක් ගෙවා පරිගණකය ලබාගත හැකි බව නාගරික සභිකයින් වෙත දක්වා තිබුණි. නමුත් විගණන දිනය වූ 2023 මැයි 12 වන දින වන විටත් එක් මන්ත්‍රීවරයෙකු පමණක් පරිගණකය අපසු භාර දී තිබුණි. ඒ අනුව සභා දේපල අවිධිමත් ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් මහා නගර සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ලැප්ටොප් පරිගණක මහානගර සභාව වෙත පවරා ගැනීමට අදාල කටයුතු සිදුකරමින් පවතින බව. | සභා දේපල අවිධිමත්ව පරිහරණය කරන අය සම්බන්ධයෙන් නීති, රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.7.2 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල අංශය මඟින් ජල පරිභෝජනයේ සිදුවන වෙනස්වීම් හඳුනා ගැනීම සඳහා තොග ජල මනු සවිකිරීම හා නල මගින් ජලය බෙදාහැරීමේ ක්‍රමය යාවත්කාලීන කිරීම සඳහා තොග ජල මනු සවිකිරීමට රු.264,700 ක් වැයකර මිලදී ගෙන තිබූ ජල උපකරණ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. | නාගරික ඉංජිනේරු අංශය මගින් කරනු ලැබූ ඉල්ලීමට අනුව ජල මනු මිලදී ගෙන ගබඩාව වෙත ගෙනවිත් ඇති අතර අදාල පිරිවිතරයන්ට නොගැළපෙන නිසා ඒවා ඉංජිනේරු අංශය විසින් ඉල්ලුම් ලබාගෙන නැති හෙයින් ගබඩාවේ ඉතිරිව ඇති බව. | පිරිවිතරයන්ට අනුකූල නොවන භාණ්ඩ මිලදී ගැනීම පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2021 ජූලි මාසයේ මිලදීගත් රු.1,236,400 ක් වටිනා PE ජල උපකරණ විගණන දිනය වූ 2023 මැයි 16 දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ පැවතුණි. | කුරුණෑගල මහා නගර සභා සීමාව තුළ ඉතා සීමිත ප්‍රදේශයක සහ මහා නගර සභා සීමාවෙන් පිටත ප්‍රාදේශීය සභා සීමාව තුළ කුරුණෑගල මහා නගර සභාව මගින් ජල සැපයුම ලබාදීම පිණිස PE නල පද්ධති එළනු ලැබ ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව භාණ්ඩ හා සේවා ලබා ගැනීමේදී ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

### 3.8 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **මධ්‍යම වෙළඳපල I අදියර ඉදිකිරීමේ ව්‍යාපෘතිය** | | |
| (i) | කුරුණෑගල මහා නගර සභාවේ මධ්‍යම වෙළඳපල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ I හා II අදියර දෙක සඳහාම පෞද්ගලික ඉදිකිරීම් ආයතනයක් සමඟ ගිවිසුම්ගතව ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින අතර මෙම ඉදිකිරීම සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන්කළ යුතු වුවත් 2020 වර්ෂයේ කිසිදු ප්‍රතිපාදනයක් වෙන්කර නොතිබුණු අතර මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:3:1 වගන්තිය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර එක් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කල හැකිව තිබියදී අදියර දෙකක් ලෙස ව්‍යාපෘති 02 කින් ක්‍රියාත්මක කර තිබුණි. | CIDA ආයතනය මගින් ලබාදී ඇති සියළු මාර්ගොපදේශ ඇතුළත් කර ලංසු ලියවිලි සකස් කර ඇත. ඒ අනුව ඕනෑම ලංසුකරුවෙකුට මෙම ව්‍යාපෘතියට අදාලව තමා සතු සුදුසුකම් මොනවාද යන්න තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාව සලසා දී ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පෙන්වාදී ඇති අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මෙම ප්‍රසම්පාදන දැන්වීම පලකර ඇති අතර ඒ අනුව කුරුණෑගල මහා නගර සභාව විසින් අදාල වියදම් දරා ඇති බව. | ව්‍යාපෘතියක් ඉටු කිරීමේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහාම මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කළ යුතු වේ. සියළුම ලංසුකරුවන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීමට අවස්ථාව සලසා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | කමිටු වාර්තාවෙන් ඉංජිනේරු ඇස්තමේන්තුව වූ රු.687,068,527 ක් වන ටෙන්ඩරය රු.957,518,334 කට රු.270,449,807 ක් වැඩියෙන් එනම් සියයට 41 කට වැඩි ඉහළ ප්‍රතිශතයකින් ඉදිරිපත් කර තිබූ ලංසුකරුට ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. ලංසු මිල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 15 වැඩිවන අවස්ථාවලදී ලංසුව ප්‍රතික්ෂේප කර නැවත ලංසු කැඳවිය යුතු වුවත් ඒ පිළිබඳ සලකා බලා නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ඇස්තමේන්තු මුදලට වඩා සියයට 41 ක පමණ විචලනයක් පවතින බැවින් නැවත ප්‍රසම්පාදන කටයුතු කළ යුතුය. |
| (ආ) | **MC – Plaza ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම**<br>2020 වර්ෂයේ මහා නගර සභා ප්‍රතිපාදන මඟින් MC – Plaza ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා රු.36,499,364 ක මුදලකට ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස් කර රු.36,575,000 ක මුදලකට සෙනාරා කන්ස්ට්‍රක්ෂන් ආයතනය සමඟ ගිවිසුම්ගතව ව්‍යාපෘතිය ඉටුකර තිබූ අතර 2021 ඔක්තෝබර් 12 දින වන විට ව්‍යාපෘතිය නිමකර රු.38,116,936 ක මුදලක් ගෙවීම් සිදුකර තිබුණි. මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | විදුලි සෝපාන පද්ධතියක් සවි කිරීම හා විදුලි තරප්පුපෙළ යන වැඩ විෂයන් 02 පමණක් සිදු නොකරන ලද බව. | ඇස්තමේන්තුව ප්‍රකාරව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (i) | මෙම ගොඩනැගිල්ලේ මධ්‍යම වායු සමීකරණ පද්ධතිය අක්‍රිය බැවින් එය ඉවත් කිරීම, නව ව්‍යාපාරික ස්ථාන කිහිපයක් ඉදිකිරීම දැනට දැඩි ලෙස අබලන් වී ඇති විදුලි සෝපාන පද්ධතිය හා විදුලි තරප්පුපෙළ නැවත සවිකිරීම, වැසිකිළි පද්ධතිය සහ සිවිලිම අලුත්වැඩියා කර මෙම ගොඩනැගිල්ලට නව පෙනුමක් ලබාදීමට GC/06/20/2020/ 11/12 දරන මහා සභා සම්මුතිය මඟින් අනුමත කර තිබුණද අනුමත සමහර වැඩ විෂයයන් සිදුකර නොතිබුණි. | | |
| (ii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:13:1, 8:13:2 හා 8:13:3 ප්‍රකාරව කොන්ත්‍රාත් වැඩ සිදුවෙමින් පවතින අතරතුර කවර හෝ අවස්ථාවක දී වැඩවල ස්වභාව, ගුණාත්මකභාවය හෝ ප්‍රමාණය වෙනස් කිරීම සඳහා විශේෂ අනුමැතියක් ලබාගත යුතු වුවත් එවැනි විශේෂ අනුමැතියක් ලබා නොගෙන රු.19,609,744 ක අමතර වැඩ ඉටුකර තිබුණි. මෙම අමතර වැඩ ඉංජිනේරු ඇස්තමේන්තුවේ වටිනාකමින් සියයට 10 ක් නොයික්ම වියයුතු වුවත්, ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ විෂයයන් ඉටු නොකර සියයට 53 ක අමතර වැඩ ඉටුකර තිබුණි. මෙය ප්‍රසම්පාදන උපදෙස් | අමතර වැඩ විෂයන් කාර්මික නිලධාරී, නාගරික ඉංජිනේරු, නාගරික කොමසාරිස් නිර්දේශ කර අනුමත කර ඇති බව. | අතිරේක වැඩ ඇස්තමේන්තුවේ වටිනාකමින් සියයට 10 ක පමණ පරාසයක් තුළ සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුගමනය නොකිරීමක් බව නිරීක්ෂණය කෙරේ. | | |
| (iii) | අනුමත ඉංජිනේරු ඇස්තමේන්තුවේ 50% පමණ වටිනාකම වූ විදුලි සෝපාන පද්ධතිය සවි කිරීම හා විදුලි තරප්පුපෙළ නැවත සවි කිරීම යන වැඩ විෂයයන් දෙකම ඉටුකර නොතිබූ අතර ඉහත කොන්ත්‍රාත්තුවෙන් අලුත්වැඩියා නොකළ විදුලි සෝපානය සකස් කිරීම සඳහා පරිපූරකයක් අනුමත කර ගැනීමට හා 2022 අයවැය වෙත ඉදිරිපත් කිරීමට GC/06/32/2021/10/18/ED දරන ස්ථාවර කමිටු නිර්දේශ මහා සභාව ඒකමතිකව සම්මත කර තිබුණි. ඒ අනුව නිරීක්ෂණය වන්නේ අත්‍යවශ්‍ය වැඩ විෂයයන් ඉටු නොකර අමතර වැඩ ඉටුකර තිබීමකි. | විදුලි සෝපානය සවි කිරීම අත්‍යවශ්‍ය වැඩක් වුවද, මෙම කොන්ත්‍රාත් කාලය තුළ සිදු කිරීමට නොහැකි වූයේ මෙය ගෙන්වා සවි කිරීමට, එවකට පැවති තත්ත්වය අනුව වර්ෂයකට අධික කාලයක් ගතවන බැවිනි. එබැවින් 2021 වර්ෂය මෙය සිදු නොකළ අතර, 2022 වර්ෂයේ පරිපූරකයක් මගින් සිදු කිරීමට අනුමැතිය ලබා ගන්නා ලද බව. | ඇස්තමේන්තු සංශෝධනය වන අවස්ථාවේ ඒ සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතුය. |
| (iv) | අනුමත ඉංජිනේරු ඇස්තමේන්තුවේ ගිවිසුම්ගත වී එකඟ වූ වටිනාකමෙන් ඉටු නොකළ අයිතම 23 ක වටිනාකම රු.19,722,642 ක් වූ අතර එය ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 53 ක ප්‍රතිශතයක් විය. | ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ විෂයන් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගත වුවද නව ඉදිකිරීම් සිදු කිරීමේ දී, අයිතිකරුගේ (Clien) අභිමතය පරිදි ඉන් සමහර අයිතමයන් සිදු කර නැති බව. | ඇස්තමේන්තුවට අනුකූලව ඉදිකිරීම් සිදු කළ යුතුය. |
| (v) | ලංසු කැඳවීම සඳහා තාක්ෂණික ඇගයීම් මණ්ඩල තීරණය අනුව CIDA 5 හෝ ඊට වැඩි සුදුසුකම් සහිත කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවීමට තීරණය කර තිබුණද පුවත්පත් දැන්වීමේ ලංසුකරුවන්ගේ සුදුසුකම් ලෙස C - 5 ලෙස පමණක් දක්වා තිබූ අතර, ඒ තුලින් වැඩි තරඟකාරී ලංසුකරුවන් ප්‍රමාණයක් ඉදිරිපත් වීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | කුඩා පරිමාණයේ කොන්ත්‍රාත්කරුවන්ට වැඩි අවස්ථාවක් ලබාදීම අරමුණු කරගෙන C- 5 ශ්‍රේණියේ මිල ගණන් කැඳවා ඇති බව. | ප්‍රසම්පාදන දැන්වීමක තිබිය යුතු මූලිකාංග වලින් යුතුව ප්‍රසම්පාදන දැන්වීම් එලකළ යුතුය. |
| (vi) | ප්‍රසම්පාදන ලියවිලි පරීක්ෂාවේ දී කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු විසින් මිල ගණන් ඉදිරිපත්කර තිබුණි. ඉන් එක් ආයතනයක් විසින් ඉදිරිපත් කළ මිල ගණන් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් තාක්ෂණික ඇගයීම් ක්‍රියාවලි පිළිබඳ විගණයේදී සෑහීමකට පත් වීමට නොහැකි විය. | තුෂාර රූපින් සමාගමේ ලංසු ලියවිලි ගොනුවේ නොමැති බව. | ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කිරීමේදී විනිවිධභාවයකින් දෘෂ්‍ය ක්‍රියාවලියකින් යුතුව සිදු කළ යුතුය. |
| (vii) | අවසන් බිල්පත ඉදිරිපත් කිරීමේදී AC Plant එක ඉවත් කිරීමට විශේෂ මිල විශ්ලේෂණයක් ඉදිරිපත් කර ලංසුකරු ඉදිරිපත් කළ රු.60,000ක මුදල වෙනුවට රු.761,394ක වියදමක් ඉදිරිපත් කර රු.701,394 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ඇස්තමේන්තුවේ විචලතා සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර, ඇස්තමේන්තු මුදලට එකඟකරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (viii) | කොන්ත්‍රාත්කරු විසින් මුල් ඇස්තමේන්තුව පරිදි ගිවිසුම්ගත වූ වටිනාකම රු.36,575,000 ක් වුවද මෙයින් රු.18,479,222 ක් වටිනා වැඩ කොටසක් පමණක් ඉටුකර තිබුණි. එසේ වුවද අවසාන බිල්පත් පරීක්ෂාවේ දී මුල් ඇස්තමේන්තුවේ නොමැති රු.19,634,694 ක වටිනාකමින් යුත් නව වැඩ කොටස් ඉටුකර තිබුණි. නමුත් මහ නගර සභාව විසින් මේ සඳහා සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කොට අනුමත කරගෙන නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් ගත මුදල වන රුපියල් මිලියන 36,575,000 මුදලින් ගිවිසුමේ සඳහන් වැඩ කටයුතු සඳහා රුපියල් මිලියන 38,116,936 මුදලක් ද, අතිරේක වැඩ වශයෙන් රුපියල් මිලියන 19,637,711 මුදලක් ද, වැය කර එම සියළුම කටයුතු සිදුකිරීමෙන් පසු අවසන් වශයෙන් සාදන ලද සංසන්ධනාත්මක වාර්ථාව නිසි පරිදි අනුමත කර ඇත. එබැවින් මේ සඳහා වෙනම සංශෝධිත පිරිවැයක් අවශ්‍ය නොවන බව. | සංශෝධන පිරිවැය ඇස්තමේන්තුවක් නොමැතිව කොන්ත්‍රාත්කරු විසින් ඉටුකරන ලද අමතර වැඩ සඳහා ගෙවීම් නොකළ යුතුය. |
| (ix) | බිල්පත හා කොන්ත්‍රාත්කරුගේ ලංසුව පරීක්ෂාවේ දී ලංසුවෙහි සඳහන් කර ඇති ප්‍රමාණයට වඩා ඉටුකර ඇති ප්‍රමාණයටද ගෙවීම් කර තිබූ අවස්ථා 09 ක් නිරීක්ෂණය වූ අතර වටිනාකම රු.4,331,106 ක් විය. | මෙහි අයිතම අංක 04,08,10,32,36,49,58 සහ 61 සඳහා මෙම අළුත්වැඩියාවේ දී සත්‍ය වශයෙන්ම වැඩ බිමේ සිදු කරන ලද වැඩ සඳහා නිසි පරිදි මිනුම් පත් සහ මිල විශ්ලේෂණයන් සිදු කර ඇති බව. | ලංසුවේ සඳහන් කර ඇති ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කිරීමේදී ඒ සඳහා අනුමැතිය ලබාගෙන හා සත්‍ය මිනුම්පත් මත ගෙවීම් කළ යුතුය. |
| (x) | මෙම ව්‍යාපෘතිය සඳහා ගොඩනැගිලි මිල විශ්ලේෂණයේ රේටයන් භාවිතා නොකර අමතර වැඩ සඳහා විශේෂ මිල රේටයන් සකස් කර ගෙවීම් කිරීම හේතුවෙන් වැඩ විෂයයන් 08 ක රු.19,662,047 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | වෙළඳපලේ පවතින මිල ගණන් අනුව මිල විශ්ලේෂණයන් ඉදිරිපත් කරන ලදි. එය පරීක්ෂා කර බලා ගෙවීම් සිදුකර ඇති බව. | ගොඩනැගිලි මිල විශ්ලේෂණ රේටයන් පවතින විට එම රේටයන් අනුව ගෙවීම් කළ යුතය. |
| (xi) | විශේෂ මිල විශ්ලේෂණය කොන්ත්‍රාත් ආයතනය පිළියෙල කර ඇතත්, ඉංජිනේරු විසින් අනුමත කර නොතිබුණු අතර, අසාමාන්‍ය මිල විශ්ලේෂණයක් සකස් කර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව අමතර වැඩ වලට ගෙවීම් කිරීමට ගොඩනැගිලි සම්මත මිල ගණන් පවතින අයිතම සඳහා ද විශේෂ මිල විශ්ලේෂණ පිළියෙල කර තිබූ බවත් සකස් කර තිබූ සමහර විශේෂ මිල ගණන් තාක්ෂණ නිලධාරියෙකු හෝ ඉංජිනේරු පරීක්ෂා කර අනුමැතියක් ලබා දී නොතිබුණු බවත්, කොන්ත්‍රාත්කරු සකස් කර තිබූ අසාමාන්‍ය මිල විශ්ලේෂණ සඳහා ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය. | අතපසු වීමකින් එම ලේඛනය සඳහා අත්සන් යොදා නොමැති අතර නිසි ආකාරයෙන් එම මිල විශ්ලේෂණයන් පරීක්ෂා කර ගෙවීම් සිදු කර ඇති බව දන්වා ඇති බව. | විශේෂ මිල විශ්ලේෂණ ඉංජිනේරු විසින් පරීක්ෂා කර බලා අනුමත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | **දොස්තර සිල්වා මාවතේ කඩ කාමර ඉදිකිරීම ව්‍යාපෘතිය** | | |
| | මෙම කඩ කාමර බදු දීම සඳහා 2022 අගෝස්තු මස 23 වන දින ජාතික තරඟකාරී ලංසු කැඳවීමක් කර තිබූ අතර එම ලංසු විවෘත කිරීම 2022 සැප්තැම්බර් 14 දින ලෙස දැනුම් දී තිබුණද මෙම කඩ කාමර ඉදිකල ඉඩමෙන් කොටසක් සභාව සතු නොවන බවත් එය තම පල්ලිය සතු බවත් කුරුණෑගල ජාමිඋල් අසහර් බසාර් ජුම්ආ පල්ලිය විසින් සභාවේ මෙම තීරණය අභියෝගයට ලක් කරමින් කුරුණෑගල පළාත් බද මහාධිකරණයෙන් රිට් ආඥාවක් ලබාගැනීම සඳහා නඩුවක් ගොනුකර තිබූ අතර, රිට් ආඥාව ලැබෙන තෙක් මෙම කඩ කාමර බදු දීම වළක්වමින් අතුරු තහනම් නියෝගයක් ලබාගෙන තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවක් ආරම්භ කිරීමට පෙර ඉඩම්වල නිරවුල්භාවය තහවුරු කර ගැනීමට සභාවේ වගකීම වුවත් ඒ අනුව කටයුතු නොකිරීමෙන් මෙම තත්ත්වය ඇති වී තිබුණි. | වයඹ පළාත්බද මහාධිකරණයේ HCW 11/2022 අංක දරණ රිට් අයදුම්පතක් ගොනු කර ඇත. දැනටමත් නඩුව ගරු අධිකරණයේ පවත්වගෙන යන නඩුවකි. මෙම නඩුව සඳහා මේ වනතෙක් අතුරු තහනම් නියෝගයක් ලබා දී නොමැති බව. | ප්‍රසම්පාදන නීති අනුගමනය නොකිරීම තුළ නගර සභා අරමුදලට සිදු වූ අලාභය සම්බන්ධව පරීක්ෂණ පවත්වා අධිභාර පැනවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **සුන්දරාපොළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ බිම් පිරවීමේ ව්‍යාපෘතිය.** | | |
| (i) | ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා නිර්මාණය හා ඉදිකිරීමේ ක්‍රමය (Design & Build) යටතේ ඉදිකිරීමට ව්‍යාපෘති යෝජනා කැඳවීමෙන් L.D. කන්ස්ට්‍රක්ෂන් හා සන්පවර් කන්ස්ට්‍රක්ෂන් බද්ධ ව්‍යාපාරය සමඟ රු.100,000,000 කට ගිවිසුම්ගතව ව්‍යාපෘතිය ඉටුකරමින් පැවතුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ අයවැය තුළින් රු. මිලියන 42ක් පුනරාවර්තන වියදම් යටතේද, 2022 වර්ෂයේ රු. මිලියන 30 ක මුදලක් වෙන් කරන ලද බව. | වාර්ෂික අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සලසවා නොගෙන ගෙවීම් නොකළ යුතුය. |
| (ii) | පෞද්ගලික ඉදිකිරීම් ආයතන 02 ක බද්ධ ව්‍යාපාරයක් ලෙස මෙම කොන්ත්‍රාත්තුව ඉටුකිරීමට ගිවිසුම්ගත වුවද පුවත්පත් දැන්වීමට අනුව මෙම ආයතන ICTAD ශ්‍රේණිගතකිරීමට අනුව C3 හෝ ඉහල ශ්‍රේණියක සිටිය යුතු වේ. එසේ වුවද මෙම ආයතන 02 කින් ICTAD ලියාපදිංචිය ලබා තිබුණේ එක් ආයතනයක් පමණි. | CIDA ලියාපදිංචිය පිළිබඳ තහවුරු ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | ප්‍රසම්පාදන දැන්වීමක තිබිය යුතු මූලිකාංග වලින් යුතුව ප්‍රසම්පාදන දැන්වීම් එලකළ යුතුය. |
| (iii) | මෙම කොන්ත්‍රාත්තුව සඳහා මූලික වියදම් සඳහා ඇස්තමේන්තුව අනුව මුළු කොන්ත්‍රාත් වටිනාකම වන රු.239,843,470 ක මුදලින් රු.25,870,000 ක මුදලක ප්‍රතිපාදනයක් වෙන්කර තිබූ අතර මූලික වියදම් සඳහා ගෙවීම් කිරීමේදී සියළුම මූලික පහසුකම් කොන්ත්‍රාත්කරු විසින් ආයතන පරිශ්‍රය තුල ස්ථාපිත කර තිබිය යුතු වුවත්, ඇස්තමේන්තුවේ සඳහන් සියළුම මූලික පහසුකම් සපයා නොතිබූ අයිතම 03 ක් වෙනුවෙන් රු.2,850,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. | සේවා යෝජකයා/ උපදේශක නිලධාරීන්ගේ කාර්යාලයට අවශ්‍ය මේස පුටු යොදා පිළියෙල කර ඇති අතර සන්නිවේදන පහසුකම් සැපයීම යටතේ WI-FI අන්තර්ජාල පහසුකම් හා සන්නිවේදන පහසුකම් සපයා ඇත. උපදේශක කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා එම කාර්යාලයට යාබදව වැසිකිළි පහසුකම් නිසි පිරිවිතරයන්ට අනුව සපයා ඇති බව. | නොකළ වැඩ වෙනුවෙන් ව්‍යාජ බිල්පත් සකස් නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | අයිතම අංක 1:14 යටතේ කොන්ත්‍රාත්කරුගේ කාර්යය මණ්ඩලය සඳහා රු.9,260,000 කට ලංසුවක් ඉදිරිපත් කර තිබුණි. මෙම කොන්ත්‍රාත් පිරිවැය අනුව කාර්යය මණ්ඩලයේ සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මේ සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තු කාර්යය මණ්ඩලය සම්පූර්ණ කර නොතිබියදීත් කොන්ත්‍රාත් වටිනාකමින් 40% වන රු.3,504,000 ක් ගෙවා තිබුණි. | මුල් අදියරේදී සම්පූර්ණ ව්‍යාපෘතියෙන් කොටසක් පමණක් සිදු කරනු ලබයි. මෙම කොටසේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී සම්පූර්ණ ව්‍යාපෘතියෙහි කළ යුතු සියලුම අංග සිදු කිරීම අවශ්‍ය වන බව. | නොකළ වැඩ වෙනුවෙන් ව්‍යාජ බිල්පත් සකස් නොකළ යුතුය. |
| (v) | අයිතම අංක 1:14 යටතේ රු.239,843,470 කොන්ත්‍රාත් වටිනාකම කොන්ත්‍රාත්කරුගේ කාර්යය මණ්ඩලය සඳහා රු.9,260,000 කට ලංසුවක් ඉදිරිපත් කර ඇති බැවින් රු.100,000,000 ගිවිසුම්ගත වටිනාකම කාර්යය මණ්ඩලය සඳහා ගෙවීම් කිරීමේදී මුළු කාර්යය මණ්ඩල පිරිවැයෙන් කොන්ත්‍රාත් වටිනාකමේ ප්‍රතිශතය 41% වන බැවින් කාර්යය මණ්ඩලයට ගෙවිය යුතු මුදල රු. 3,796,600 විය යුතු අතර එම වටිනාකමින් කොන්ත්‍රාත්තුව නිමවන ප්‍රතිශතය අනුව ගෙවීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව බිල්පත් පරීක්ෂාවේදී රු.1,985,360 මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | රාජකාරිය සඳහා වාර්තා කරන කොන්ත්‍රාත්කරුගේ නිලධාරින් ලොග් සටහන් යෙදීම සිදු නොකරන අතර උපදේශක නිලධාරින් පමණක් අවශ්‍ය අවස්ථාවල ලොග් සටහන් යොදා ඇති බව. | ඇස්තමේන්තුගත ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කිරීමේදී ඒ සඳහා අනුමැතිය ලබාගෙන හා සත්‍ය මිනුම්පත් මත ගෙවීම් කළ යුතුය. |
| (vi) | බිල්පතෙහි 3.2.3 අයිතමය අනුව Leachate line preparation සඳහාද සමස්ත ව්‍යාපෘතියටම රු.10,027,500 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද මෙයින්ද රු.7,019,250 ක මුදලක් එනම් සියයට 70 ක ප්‍රතිශතයක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණි.ඉදිරිපත් කරන ලද බිල්පත අනුව 2022 සැප්තැම්බර් 12 දින විගණනයෙන් තහවුරු කරගන්නා විට 1000 160mm PVC බටයක වෙළඳපල මිල රු.53,996 ක් වීමෙන් රු.1,799,900 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. ඒ අනුව සාවද්‍ය බිල්පතක් විගණනය වෙත ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය කෙරේ. | අයිතම අංක 3.2.3 යටතේ leachate line preparation සඳහා වෙන් කර ඇති මුදල වන රු.7,019,250 මුදලින් මෙම බට සැපයීම වෙනුවෙන් රු.7,019,250 ක මුදලක් ගෙවා ඇති බව. | නොකළ වැඩ වෙනුවෙන් ව්‍යාජ බිල්පත් සකස් නොකළ යුතුය. |
| (ඉ) | **කුරුණෑගල මහා නගර සභාව විසින් සායන මධ්‍යස්ථානය හා පෙර පාසල ඉදිකිරීම** | | |
| (i) | කුරුණෑගල මහා නගර සභාව විසින් සායන මධ්‍යස්ථානය හා පෙර පාසල ඉදිකිරීම සඳහා රු.230,186,606 ක ඇස්තමේන්තුවක් සකස් කර CCD කන්ස්ට්‍රක්ෂන් ආයතනය සමඟ රු.232,122,585 ක ගිවිසුමකට එළඹ තිබූ අතර, බිල්පත් අනුව රු.10,262,744 ක මුදලක් ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් ලිපිගොනු භෞතික පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය. ලංසු කැඳවීම සඳහා තාක්ෂණ මණ්ඩල තීරණය අනුව CIDA 3 හෝ ඊට වැඩි සුදුසුකම් සහිත කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවීමට තීරණය කර තිබුණද පුවත්පත් දැන්වීමේ ලංසුකරුවන්ගේ සුදුසුකම් ලෙස C3 ලෙස පමණක් දක්වා තිබූ අතර, ඒ තුළින් වැඩි තරඟකාරී ලංසුකරුවන් | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ප්‍රසම්පාදන දැන්වීම් එල කිරීමේදී නිලධාරීන් වගකීමෙන් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණයක් ඉදිරිපත් වීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | | |
| (ii) | නව සායන මධ්‍යස්ථානය ඉදිකිරීමේ දී පැරණි සායන මධ්‍යස්ථානයෙන් ගලවා ඉවත් කර ගබඩාවට ලබාදී තිබූ උපකරණ ගබඩාවේ තොග පොත් වලට ඇතුළත් කර වාර්තා තබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | නිවැරදිව ලේඛනගත කර ගබඩාවලට භාරගත යුතු වේ. |
| (iii) | කොන්ත්‍රාත්තුවේ බිල් ගෙවීමේ දී රු.694,315ක Idle කාලය සඳහා දක්වමින් වැඩබිමේ ඉදිකිරීම් නතර කර තිබූ දින 6 ක කාලය සඳහා යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේ දී පුළුල් අයුරින් කළු ගල කඩා ඉවත් කිරීමක් සිදු කිරීමට සිදුවේයැයි අපේක්ෂා නොකළ අතර, ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුව පුළුල් අයුරින් කළුගල කඩා ඉවත් කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි වූ හෙයින් දින 06 ක කාලයක් වැඩබිමෙහි වැඩ තාවකාලිකව නතර කරන ලදි. මෙම කළුගල පුළුල් ලෙස කඩා ඉවත් කිරීමේ හේතුව නිසාවෙන් පමණක් පරිසර බලපත්‍ර ලබා ගැනීමට සිදුවී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ගෙවීම් කළ යුතු වේ. |
| (ඊ) | **බස් නැවතුම්පල වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය** | | |
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:3:2 ප්‍රකාරව ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීමක ඇතුළත් කළයුතු ප්‍රධාන සුදුසුකම් හා පළපුරුද්ද CIDA ශ්‍රේණිගත කිරීම ලංසු ආරාධනා කිරීමට පුවත්පතේ පළකළ දැන්වීමේ දක්වා නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාලව පල කල පුවත්පත් දැන්වීමේ ඉදිරිපත්වන ලංසුකරුවන් කර්මාන්ත හා ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී තිබිය යුතු බව දන්වා ඇත. එමෙන්ම ලංසුකරුවන් වෙත නිකුත් කරන ලද ලංසුලේඛන වල අදාල සුදුසුකම් C7 ක් ලෙස පැහැදිලිව දක්වා ඇති බව. | ප්‍රසම්පාදන දැන්වීමක් පළ කිරීමේදී නිලධාරීන් වගකීමෙන් කටයුතු කළ යුතුය. |
| (ii) | මෙම කොන්ත්‍රාත්තුව ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ රු.459,590 ක කාර්යය සාධන සුරක්ෂණය හා රු.1,838,361 ක අත්තිකාරම් සුරක්ෂණය ව්‍යාජ ඒවා විය. මෙම ව්‍යාජ සහතික පිළිබඳව කිසිදු පරීක්ෂාවකින් තොරව රු.1,838,311 ක අත්තිකාරම් මුදල් හා කොටස් මුදල් නිදහස් කර තිබූ බව නිරීක්ෂණය විය. 2022 අප්‍රේල් මස මුදල් පිළිබඳ ස්ථාවර කමිටු නියෝගය අනුව මෙම කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති රුපියල් ලක්ෂ 18 ක මුදල අත්තිකාරම් සුරක්ෂණය හා කාර්යය සාධන ඇපකර මඟින් ප්‍රතිපූර්ණය කරගත යුතු බව දක්වා ඇතත් ව්‍යාජ සුරක්ෂණ ඉදිරිපත් කර ඇති බැවින් මෙම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | තාක්ෂණික ඇගයීම් කමිටුවට පත්කළ නිලධාරීන්ට හා ප්‍රසම්පාදන කමිටුවට පත් වූ නිලධාරීන් වගකීමෙන් තොරව කටයුතු කිරීම පිළිබඳව පරීක්ෂණ පවත්වා නගර සභා අරමුදලට සිදු වූ අලාභය අය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | රු. 9,191,808 වටිනාකම වූ මෙම ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 09 දින අවසන් විය යුතු වුවත් එදිනට නිමකර නොතිබූ අතර මෙම ව්‍යාපෘතිය කිසිම හේතුවක් නොමැතිව 2022 අප්‍රේල් 09 දක්වා කාලය දීර්ඝ කිරීමටද කටයුතු කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති නිමකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කළ යුතු අතර ගිවිසුම්ගත කාලය දීර්ඝ කරන්නේ නම් පිළිගත හැකි හේතු ඉදිරිපත් කළ යුතුය. |
| (iv) | ව්‍යාපෘතියේ වටිනාකමින් රු.7,438,404 ක් වටිනා වැඩ විෂයයන් ඉටු කිරීමට කොන්ත්‍රාත්කරු කටයුතු කර නොතිබුණද මහා නගර සභාවේ බලධාරීන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ඉදිකිරීම් කටයුතු වගකිව යුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්විය යුතුය. |
| (v) | මෙම වැසිකිළි පද්ධති ඉටු නොකර අතහැර දැමීම හේතුවෙන් බස් නැවතුම්පොළ කඩ හිමියන්ගේ මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමේ අපහසුතාවයක් පැවතුණු අතර ඉදිකරමින් පවතින වැසිකිළිවලට විවිධ පුද්ගලයින් අපවිත්‍ර කර තිබූ බවද නිරීක්ෂණය විය. සමහර වැසිකිළිවල කොන්ක්‍රීටය තුළ වතුර එකතු වී මදුරු උවදුරු මෙන්ම මෙම වැසිකිළිවලින් අධික දුර්ගන්ධයක් වහනය වන බව නිරීක්ෂණය විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | පොදු මහජනතාවට සේවාව ලබා දීමට හැකි අයුරින් ව්‍යාපෘතිය කඩිනමින් නිමකළ යුතුය. |

**04. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුරුණෑගල මහා නගර සභාවට අයත් වාහන නැවතුම්පල 4ක් බදු දීම සඳහා පත්තර දැන්වීමක් පලකර මිල ගණන් කැඳවා බදු දී තිබූ අතර, වැඩිම මිල ගණන් ඉදිරිපත් කර තිබූ Broad Way Car park Solution වෙත ඉහත වාහන නැවතුම්පලවල් 4 ම බදු දී තිබුණි. බෝධිරාජ මාවත බදු ගැනීම Broad Way Car park විසින් පසුව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් දෙවන වැඩිම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනය වෙත බදු දී තිබුණි. මේ සම්බන්ධයෙන් ලංසු කැඳවීමේ ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සහ ප්‍රසම්පාදන කමිටුව විසින් පරීක්ෂා කොට අනුමත කළ යුතු වුවත් ඉහත ප්‍රසම්පාදනයට අදාල ලංසු කැඳවීමේ ලේඛන සඳහා ප්‍රසම්පාදන කමිටුවේ සහ ඇගයීම් කමිටුව අනුමත කර නොතිබුණි. | ඉදිරියේදී සියලු ලංසු ලේඛන තාක්ෂණ කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කර ගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාර්ෂික බදු මුදලින් 1/3 ක් ගිවිසගන්නා අවස්ථාවේදී ඉතිරි 2/3 ගිවිසුම්ගතව තුන්වන මාසයෙන් ආරම්භව මාස 06 ක් ඇතුළත සමාන වාරික 06 න් ගෙවිය යුතු වුවත් Broad way car park විසින් මහ වීදිය i, මහ වීදිය ii හා මිහිදු මාවත යන වාහන නැවතුම්පලවල් සඳහා ගෙවිය යුතු 2/3 ක මුදල වන රු.3,579,520 ක මුදල ගෙවීම පැහැර හැරී තිබුණි. | 2022 සැප්තැම්බර් 27 දින සිට දින 14 ක් ඇතුළත ගෙවිය යුතු බවත් ගාස්තු ගෙවීමක් සිදු නොකළහොත් නැවත දැනුම් දීමකින් තොරව ගිවිසුම අවලංගු කර නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවත් අංක SFC/05/2022/09/27/MA/R/7 යටතේ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව නිර්දේශ කර ඇති බව. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කර, හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.2 ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ඇස්තමේන්තු වටිනාකම රු.94,000,000 ක් වූ ව්‍යාපෘති 25 ක් වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | වැව්ගලේ ජනතාවට වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමට යෙදවූ අතර ඉතිරි මුදල අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවූ බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කළ යුතුය. |